# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2019 (නව නිර්දේශය)

# 52 - නර්තනය

## ප්‍රශ්නපත්‍ර ව්‍යුහය හා ලකුණු බෙදීයාම

### I පත්‍රය

කාලය පැය 02 යි.

වරණ 5 න් යුත් බහුවරණ ප්‍රශ්න 25 ක් හා කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්න 25 කි.

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් ප්‍රශ්න 50 කි. (50 x 02) මුළු ලකුණු 100 කි.

### II පත්‍රය

කාලය පැය 03 යි.

මෙම ප්‍රශ්න පත්‍රය I, II හා III වශයෙන් කොටස් තුනකින් සමන්විත වේ.

I කොටස - ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න 02 කි.
1 හා 2 ප්‍රශ්න අනිවාර්ය වේ.

II කොටස - ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න 03 කි.
අවම වශයෙන් එක් ප්‍රශ්නයකටවත් පිළිතුරු සැපයිය යුතුය.

III කොටස - ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න 03 කි.
අවම වශයෙන් එක් ප්‍රශ්නයකටවත් පිළිතුරු සැපයිය යුතුය.

II හා III කොටස්වලින් අවම වශයෙන් එක් ප්‍රශ්නය බැගින් හෝ තෝරාගෙන, අනිවාර්යය ප්‍රශ්න 02 ද ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සැපයිය යුතුය.

සෑම ප්‍රශ්නයකම (i) කොටසට ලකුණු 06 ක්ද (ii) කොටසට ලකුණු 06 ක්ද (iii) කොටසට ලකුණු 08 ක්ද වශයෙන් මුළු ලකුණු 20 බැගින් හිමිවේ.

| | |
|---|---|
| පළමු පත්‍රය (ප්‍රශ්න 50 x 2) | ලකුණු 100 |
| දෙවන පත්‍රය (ප්‍රශ්න 20 x 5) | ලකුණු 100 |
| I හා II පත්‍ර සඳහා 100 + 100 | ලකුණු $\frac{200}{2}$ |
| අවසාන ලකුණු | ලකුණු 100 |

# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.

2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.

3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.

4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමග □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) ..................................................... √ △ $\frac{4}{5}$

(ii) ..................................................... √ △ $\frac{3}{5}$

(iii) ..................................................... √ △ $\frac{3}{5}$

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = □ $\frac{10}{15}$

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.

2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.

3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රය සඳහා බහුවරණ පිළිතුරු පත්‍රයක් පමණක් ඇති විට ලකුණු ලැයිස්තුවට ලකුණු ඇතුළත් කිරීමෙන් පසු අකුරෙන් ලියන්න. අනෙකුත් උත්තරපත්‍ර සඳහා විස්තර ලකුණු ඇතුළත් කරන්න. 51 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර අකුරෙන් ද ලිවිය යුතු වේ.

***

**අභිමතාර්ථ -**

I වන ප්‍රශ්න පත්‍රය

01. දේශීය නර්තන කලාවේ සාම්ප්‍රදායික නර්තන, ගායන, වාදන හා තාල පද්ධතිය පිළිබඳ න්‍යායාත්මක කරුණු අවබෝධයෙන් යුතුව ප්‍රකාශ කරයි.
02. දේශීය නර්තන කලාවේ ඓතිහාසික තොරතුරු, ශාන්තිකර්මවල අනන්‍යතා ලක්ෂණ, ආගමික, සමාජීය හා සංස්කෘතික වටිනාකම අගය කරයි.
03. භාරතීය නර්තනවල සාම්ප්‍රදායික ලක්ෂණ, තාල අවබෝධය හා බටහිර බැලේ සම්ප්‍රදායෙහි විශේෂතා පිළිබඳ අවබෝධයෙන් විශ්ලේෂණය කරයි.
04. ජාතික සංස්කෘති උරුමයන් හා පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කරගනිමින් උසස් කලාකෘති හා නිර්මාණ නම් කරයි.
05. නව නර්තන නිර්මාණ, කැටයම් කලාව ආනුෂංගික කලා පිළිබඳ වටිනාකම ප්‍රකාශ කරයි.

II වන ප්‍රශ්න පත්‍රය

01. දේශීය නර්තන කලාවේ සම්ප්‍රදායික නර්තන / ගායන, වාදන හා එහි අන්තර්ගත තාල පද්ධතිය වෙන්කොට හඳුනා ගනිමින් තාල ප්‍රස්තාරකරණය භාවිත කර විශ්ලේෂණය කරයි.
02. දේශීය නර්තන කලාවේ යුගාන්තර විකාශනය, ශාන්තිකර්ම තුලනය, ආගමික, සමාජීය හා සංස්කෘතික වටිනාකම අගය කරයි.
03. භාරතීය නර්තන සම්ප්‍රදා, බටහිර බැලේ රංගකලාව පිළිබඳ ඓතිහාසික තොරතුරු, වෙනස්කම් පිළිබඳ දැනුම, අවබෝධය හා භාවිතයෙන් විශ්ලේෂණ හැකියාව ප්‍රදර්ශනය කරයි.
04. පර්යේෂණ කෘති පරිශීලනයෙහි වටිනාකම හා නිර්මාණාත්මක නර්තන, අද්‍යතන ප්‍රාසංගික වේදිකාව හා ආනුෂංගික කලාවන් අගය කරයි.
05. ජාතික උරුම, සමාජීය පසුබිම මනා චින්තනයෙන් හා උසස් රසඥතාවයෙන් යුතුව අධ්‍යයනය කරමින් බහුවිධ සංස්කෘතිකාංගවල වටිනාකම විචාරාත්මකව විග්‍රහ කරයි.

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය / புதிய பாடத்திட்டம் / New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

2019.08.07 / 0830 - 1030

නර්තනය - (දේශීය) I
நடனம் - (தேசிய) I
Dancing - (Indigenous) I

52 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

විභාග අංකය : ..........................................

පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා

| පිටු අංකය | ප්‍රශ්න අංක | ලකුණු |
|---|---|---|
| 01 | 01 - 03 | |
| 02 | 04 - 13 | |
| 03 | 14 - 23 | |
| 04 | 24 - 35 | |
| 05 | 36 - 42 | |
| 06 | 43 - 50 | |
| එකතුව | | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂකගේ | | |
| 2 වන පරීක්ෂකගේ | | |
| අති/ප්‍රධාන පරීක්ෂකගේ | | |
| ගණිත පරීක්ෂකගේ | | |
| ප්‍රධාන පරීක්ෂකගේ | | |

**උපදෙස්:**

- ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සැපයිය යුතු ය.
- එක් ප්‍රශ්නයකට ලකුණු **02** බැගින් මුළු ලකුණු **100** කි.

- අංක **01** සිට **25** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී නිවැරදි හෝ වඩාත් ම ගැළපෙන හෝ පිළිතුර තෝරා, ඊට අදාළ **අංකය** ප්‍රශ්නය ඉදිරියෙහි ඇති **වරහන තුළ ලියන්න.**

**1.** 'මංගලම්' නර්තනයට අදාළ මූලික බෙරපදය වන්නේ,
(1) ගත් දිත් තත් දොම් තකු දොම්
(2) දොං තකු දං ගජිංත
(3) දොං තකු දොං ජිං තක තරිකිට
(4) කුං දිත් තත් දොං තක තරිකිට
(5) දොංතකු දොංතකු දොංජිං ගත් තත් ජිං තරිකිට (.........)

**2.** කෝලාට්ටම්, සුලකු සහ වෙම්බු යන ද්‍රවිඩ ගැමි නැටුම්වලට සමාන සිංහල ගැමි නැටුම් ලෙස සැලකෙන්නේ,
(1) ලී කෙළි, කුලු සහ කළගෙඩි නැටුම් ය.
(2) ලී කෙළි, කුලු සහ සවරම් නැටුම් ය.
(3) කුලු , කළගෙඩි සහ මෝල්ගස් නැටුම් ය.
(4) කුලු , සවරම් සහ පතුරු නැටුම් ය.
(5) ගොයම් කැපීම, සවරම් සහ තාලම් නැටුම් ය. (.........)

**3.** "දොංත ගතම් දොංත ගතිගතම්...." යන පදයෙන් සභාවට පිවිසෙන කෝලම් චරිතය වන්නේ,
(1) මුදලි ය. (2) අණ බෙරකරු ය. (3) ජසයා ය.
(4) ලෙන්චිනා ය. (5) නොංචි ය. (.........)

4. "වල් විදුනා රැගෙන ගෙනා හිමි ගිණිකොණ වැඩ සිටිනා"
මෙම බලි කවි පාදයෙහි දැක්වෙන '**වල් විදුනාව**' යනුවෙන් හඳුන්වන්නේ,
(1) අත්මිණිය ය. (2) විජිනිය ය. (3) ඊතලය ය. (4) පන්දම ය. (5) උඩැක්කිය ය.
(.........)

5. කරුණ, භයානක සහ බීභත්ස්‍ය යන රසයන්ගෙන් නිෂ්පන්න වන භාවයන් වන්නේ,
(1) භය, ශෝක සහ උත්සාහයයි. (2) භය, ශෝක සහ විශ්මයයි.
(3) ශෝක, භය සහ ජුගුප්සාවයි. (4) ශෝක, භය සහ හාස්‍යයයි.
(5) ශෝක, භය සහ රතියයි.
(.........)

6. අනුරාධපුර කුට්ටම් පොකුණ අසලින් ලැබුණු ලෝකඩ රූපයෙන් පිළිබිඹු වන්නේ,
(1) නිළියන් සහ නළුවන්ගේ රූප පෙළකි.
(2) බෙර වාදකයකුගේ රූපයකි.
(3) භ්‍රමණය වන නළඟනකගේ නර්තන විලාසයකි.
(4) වීණා වාදකයින් සහ තාලම්පට වයන රූපයකි.
(5) නටන ස්ත්‍රියක සහ පුරුෂයකුගේ විලාසයකි.
(.........)

7. රිරි යකාගේ වස්ත්‍රය සහ වෙස්මුහුණ සඳහා භාවිත කෙරෙන වර්ණය වන්නේ,
(1) සුදු වර්ණයයි. (2) නිල් වර්ණයයි.
(3) කහ වර්ණයයි. (4) රතු වර්ණයයි.
(5) කොළ වර්ණයයි.
(.........)

8. උඩරට, පහතරට සහ සබරගමු ශාන්තිකර්මවලට අයත් නාට්‍යමය පෙළපාළි අවස්ථා පිළිවෙළින්,
(1) ඌරා යක්කම, නානුමුරය සහ පොත්කඩේ යක්කම වේ.
(2) ඌරා යක්කම, කෝල්මුරය සහ අසුර යක්කම වේ.
(3) නයා යක්කම, පොත්කඩේ යක්කම සහ දර්ශන යක්කම වේ.
(4) ආවැන්දුම, නානුමුරය සහ දළුමුර පාළිය වේ.
(5) ගුරුගේමාලාව, නානුමුරය සහ දේවකෝල්පාඩුව වේ.
(.........)

9. පහත දැක්වෙන වරණ අතුරෙන් **වරම්** කවියක් ලෙස සැලකිය හැකි කවි පාදය කුමක් ද?
(1) ඇත සිට පෙරුමන් පුරාගෙන .... (2) ආලවඩන ගන්ධ කුටියේ ....
(3) අනේ මී මැස්සේ මල් රොන් .... (4) මම සිරස මුනින්දා බුද්ධ රාජං ....
(5) සිහින් සිනිඳු සළුව පැළඳ ....
(.........)

10. සබරගමු සහ පහතරට නර්තන සම්ප්‍රදායන්ට අයත් නර්තන අංග පිළිවෙළින්,
(1) ගමන් මාත්‍රය සහ මුල් මාත්‍රය වේ. (2) ගමන් මාත්‍රය සහ තිත් මාත්‍රය වේ.
(3) ශුද්ධ මාත්‍රය සහ සින්දු මාත්‍රය වේ. (4) පට්ටුතල් මාත්‍රය සහ මුල් මාත්‍රය වේ.
(5) පට්ටුතල් මාත්‍රය සහ ශුද්ධ මාත්‍රය වේ.
(.........)

11. අඬ ඉර, බොකු හම් සහ ගැටිය යොදාගනු ලබන්නේ පිළිවෙළින්,
(1) ගැට බෙරය, පහතරට බෙරය සහ බුම්මැඩිය සඳහා ය.
(2) ගැට බෙරය, පහතරට බෙරය සහ දවුල සඳහා ය.
(3) ගැට බෙරය, රබාන සහ දවුල සඳහා ය.
(4) උඩැක්කිය, තම්මැට්ටම සහ දවුල සඳහා ය.
(5) උඩැක්කිය, රබාන සහ තම්මැට්ටම සඳහා ය.
(.........)

12. 'රූ රසේ අඳිනා ලෙසේ අත් ළෙල දිදී විදුලිය පබා .....' යන කවිය සඳහන් වන්නේ,
(1) ගම්පළ යුගයට අයත් තිසර සංදේශයේ ය.
(2) ගම්පළ යුගයට අයත් මයුර සංදේශයේ ය.
(3) කෝට්ටේ යුගයට අයත් සැළලිහිණි සංදේශයේ ය.
(4) කෝට්ටේ යුගයට අයත් ගුත්තිල කාව්‍යයේ ය.
(5) කෝට්ටේ යුගයට අයත් පරෙවි සංදේශයේ ය.
(.........)

13. පාසල් අධ්‍යාපනයේ නර්තන විෂය සම්බන්ධ ව පත් වූ ප්‍රථම අධ්‍යක්ෂවරයා වන්නේ,
(1) ඇස්. පණිභාරත ය. (2) ඩබ්ලිව්. බී. මකුලොලුව ය.
(3) එස්. එල්. බී. කපුකොටුවේ ය. (4) ජේ. ඊ. සේදරමන් ය.
(5) ශ්‍රී ජයනා රාජපක්ෂ ය.
(.........)

**14.** 'උනුනුපියන' යනුවෙන් හඳුන්වන්නේ,
(1) කපුයක්කාරියෙහි භාවිත කපුයන්තරයයි. (2) කපුයක්කාරියෙහි භාවිත නානුමුර වට්ටියයි.
(3) සන්නියකුමේ භාවිත පිදවිලි වට්ටියයි. (4) නානුමුරයේ දී භාවිත වට්ටියෙහි පියනයි.
(5) නානුමුරයෙහි භාවිත නානුමුර වට්ටියයි. (.........)

**15.** 'සිරිවසගෙන අසු නැගෙමින් නොලෙසා ....' මෙම කවියෙන් කියැවෙන්නේ කුමන ග්‍රහයා පිළිබඳව ද?
(1) කුජ ග්‍රහයා (2) රවි ග්‍රහයා (3) සිකුරු ග්‍රහයා
(4) බුද ග්‍රහයා (5) ශනි ග්‍රහයා (.........)

**16.** කෝලම් නාටකයේ එන ජස කෝලම හා සම්බන්ධ වන අනෙකුත් චරිත වන්නේ,
(1) ලෙන්චිනා, පුරන්සිනා සහ මුදලි ය. (2) ලෙන්චිනා, නොංචි සහ මුදලි ය.
(3) ලෙන්චිනා, අණබෙර සහ චුක්කිනියා ය. (4) පුරන්සිනා, අණබෙර සහ ධුංගුරුවා ය.
(5) අණබෙර, හෙන්චප්පු සහ හේවාරාළ ය. (.........)

**17.** කොහොඹා යක් කංකාරියේ දී වාදන ශිල්පියාගේ කුසලතාව වඩාත් ඉස්මතු වන්නේ,
(1) ආවැන්දුම සහ මඟුල් බෙර වාදනයේ දී ය. (2) යක්ඇනුම සහ මඟුල් බෙර වාදනයේ දී ය.
(3) යක්ඇනුම සහ අත්‍යා බෙර වාදනයේ දී ය. (4) යක් තුන්පදය සහ අත්‍යා බෙර වාදනයේ දී ය.
(5) යක් තුන්පදය සහ පිං බෙර වාදනයේ දී ය. (.........)

**18.** '**ගවරමලට**' විශේෂ ස්ථානයක් හිමිවන ශාන්තිකර්මය වන්නේ,
(1) කඩවර කංකාරියයි. (2) වලියක් මංගල්‍යයයි.
(3) කිරි ඉතිරුම් මංගල්‍යයයි. (4) කොහොඹා යක් කංකාරියයි.
(5) මුට්ටි මංගල්‍යයයි. (.........)

**19.** සූවිසි විවරණ කවි පාදය ඇතුළත් වරණය කුමක් ද?
(1) ආලවඩන ගන්ධ කුටියේ මුනි වැඩ සිටගෙන ......
(2) බුද්ධං සරණේ සිරස දරාගෙන .....
(3) ධීර ගුණැති දීපංකර මුනි බුදු වෙමිනේ ........
(4) වරම් වරම් ඉර සඳ දෙවි අතින් වරම් ......
(5) වේවා බෝසත් සිරි ජයමංගල ...... (.........)

**20.** සාම්ප්‍රදායික බලි රූපයක් වර්ණ ගැන්වීම සඳහා යොදාගනු ලබන්නේ,
(1) ගස්වල පොතු, කිරි මැටි සහ තේ කොළ ය.
(2) ගස්වල පොතු, බුලත් විට සහ දැලි ය.
(3) ශාක පත්‍ර යුෂ, ගඩොල් කුඩු සහ පැන්කේක් ය.
(4) ශාක පත්‍ර යුෂ, දැලි සහ පවුඩර් ය.
(5) ශාක පත්‍ර යුෂ, දැලි සහ අඹරාගත් කහ ය. (.........)

**21.** කථක් නර්තනය සඳහා භාවිත වාද්‍ය භාණ්ඩ වන්නේ,
(1) පඛාවජ්, මද්දල සහ හාර්මෝනියම් වේ.
(2) පඛාවජ්, තබ්ලාව සහ හාර්මෝනියම් වේ.
(3) වෙන්ඩාව, මෘදංගම් සහ කෝල් බෙරය වේ.
(4) වෙන්ඩාව, පඛාවජ් සහ වීණාව වේ.
(5) වෙන්ඩාව, තබ්ලාව සහ වයලීනය වේ. (.........)

**22.** මාත්‍රා 2 + 4 තාල රූපයට සමාන වන කර්ණාටක තාලය වන්නේ,
(1) රූපක තාලයයි. (2) ආදි තාලයයි.
(3) මිශ්‍ර චාපු තාලයයි. (4) ඛණ්ඩ චාපු තාලයයි.
(5) තිශ්‍ර චාපු තාලයයි. (.........)

**23.** රංග වින්‍යාසයේ මූලික සංකල්පයක් වන චලනයෙහි ස්වභාවය වෙනස් වීම කෙරෙහි බලපාන සාධක වන්නේ,
(1) කාලය, වේගය, දුර සහ අවකාශය වේ.
(2) තාලය, අංග, ප්‍රත්‍යාංග සහ උපාංග වේ.
(3) ශක්තිය, කාලය, හැඩතල සහ ප්‍රත්‍යාංග වේ.
(4) ශක්තිය, කාලය, වේගය සහ දුර වේ.
(5) ශක්තිය, කාලය, වේගය සහ හැඩතල වේ. (.........)

**24.** මන්තිරි වන්නම, මහබෝ වන්නම සහ නළගන වන්නම යන නවතම වන්නම් රචනය කර ඇත්තේ පිළිවෙළින්,
(1) මුදියන්සේ දිසානායක, ඩබ්ලිව්. ඩී. අමරදේව සහ ආරියරත්න කළුආරච්චි ය.
(2) මුදියන්සේ දිසානායක, ඩබ්ලිව්. ඩී. අමරදේව සහ ජයසේන කෝට්ටේගොඩ ය.
(3) ආරියරත්න කළුආරච්චි, ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ සහ ප්‍රේමකුමාර එපිටවෙල ය.
(4) ආරියරත්න කළුආරච්චි, ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ සහ මුදියන්සේ දිසානායක ය.
(5) මුදියන්සේ දිසානායක, ඇස්. පණිභාරත සහ ආරියරත්න කළුආරච්චි ය. (………)

**25.**

A



B



C



ඉහත A, B සහ C රූපවලින් දක්වා ඇත්තේ පිළිවෙළින්,
(1) පහන් පැළ, ගොප් ගෙඩිය සහ සූනියම් වීදිය වේ.
(2) පහන් පැළ, ගොප් ගෙඩිය සහ කිරිමැස්ස වේ.
(3) පහන් පැළ, ගොප් ගෙඩිය සහ යහන වේ.
(4) ගොටුව, ගොප් ගෙඩිය සහ තොරණ වේ.
(5) ගොටුව, ගොප් ගෙඩිය සහ යහන වේ. (………)

- අංක **26** සිට **35** තෙක් ප්‍රශ්නවලට අදාළ පිළිතුර යොදා **හිස්තැන් පුරවන්න.**

**26.** සංඛපාල රජු හා සම්බන්ධ කතා පුවත අයත් වන්නේ…………………………………… ශාන්තිකර්මයට ය.

**27.** නාට්‍ය ශාස්ත්‍රයේ දැක්වෙන පරිදි රස නිෂ්පත්තිය සඳහා විභාව, අනුභාව සහ …………………………………… භාව සංයෝග වන බව කියැවේ.

**28.** ප්‍රංශයේ බැලේ නර්තන කලාව ව්‍යාප්ත කිරීමට පුරෝගාමී වූයේ ……………………………… රජු ය.

**29.** **මල් මඩුව** නම් වීදි සැරසිල්ල සකස් කරනු ලබන්නේ ……………………………… ශාන්තිකර්මයේ දී ය.

**30.** හඬ සුසර කර ගැනීම සඳහා **සවරම** යොදා ගනු ලබන්නේ ………………………… නම් වාද්‍ය භාණ්ඩයට ය.

**31.** ධි න | ධි ධි න | ති න | ධි ධි න
x 2 0 3

යන හින්දුස්ථානි තාලය, දේශීය තාල පද්ධතියෙහි……………………………… දෙතිතට සමාන ය.

**32.** පරන්, ඨුම්රි සහ තරානා යන නර්තන අංග ……………………… නර්තන සම්ප්‍රදායට අයත් ය.

**33.** නාට්‍ය කලාව ප්‍රධාන වශයෙන් ………………………… සහ නාට්‍ය ධර්මී යනුවෙන් කොටස් දෙකකට බෙදිය හැකි ය.

**34.** මහනුවර යුගයේ දී වන්නම් සහ ප්‍රශස්ති, ගායනා වශයෙන් ඉදිරිපත් වූයේ දළදා මාළිගා භූමියේ පිහිටි ……………………………………… දී ය.

**35.** **සිව්ලිය** නම් වූ විශේෂිත හිස් පළඳනාව පූජාවට බඳුන්වන්නේ ………………………… ශාන්තිකර්මයේ දී ය.

- අංක **36** සිට **50** තෙක් ප්‍රශ්නවලට අදාළ පිළිතුරු **තිත් ඉර** මත ලියන්න.

**36.** 'ගම්බිර කාලිංග නුවර නිරිඳුගෙ රජ වාසලයට' යන කවියෙන් නිරූපිත චරිතය සහ ගැමි නාටකය කුමක් ද?

(i) චරිතය : ..................................................................

(ii) ගැමි නාටකය :..................................................................

**37.** මුල් මාත්‍රය අන්තර්ගත නර්තන සම්ප්‍රදාය සහ එහි තාල රූපය නම් කරන්න.

(i) නර්තන සම්ප්‍රදාය : ..................................................................

(ii) තාල රූපය :..................................................................

**38.** "ලකළ පුළුලුකුළ බඳ මිණි මෙවුල් ලා - සමග රන් සළඹ රැව් දී වෙවුල් ලා"
මෙම කවි පදය අයත් සංදේශ කාව්‍යය හා එය රචනා වූ යුගය ලියා දක්වන්න.

(i) සංදේශය : ..................................................................

(ii) යුගය :..................................................................

**39.** **නටි ක්‍රැකර්** යන බැලේ නිර්මාණයෙහි නර්තන රචකයා සහ සංගීත නිර්මාණ ශිල්පියා නම් කරන්න.

(i) නර්තන රචකයා: ..................................................................

(ii) සංගීත නිර්මාණ ශිල්පියා :..................................................................

**40.** ස්ථිතික චලන හා සංචාරී චලන යනු මොනවා ද?

(i) ස්ථිතික චලන: ..................................................................

(ii) සංචාරී චලන :..................................................................

**41.** පහත **A** හා **B** රූපවලින් දැක්වෙන සන්නියකුම ශාන්තිකර්මයේ නිරූපිත චරිත නම් කරන්න.

A



B



(i) **A** රූපය: ..................................................................

(ii) **B** රූපය :..................................................................

**42.** "බුද්ධං සරණෙං සිරස දරා ගෙන..." යන කවි පදය මාත්‍රා තුනේ තාල රූපය අනුව ගැයීමේ දී ඊට අයත් සඳැස් මත් සහ ගී මත් ගණන සඳහන් කරන්න.

(i) සඳැස් මත් : ..................................................................

(ii) ගී මත් :..................................................................

**43.** **චෝලි** සහ **ඔට්ටියානම්** යන රංග වස්ත්‍රාභරණ භාවිත නර්තන සම්ප්‍රදායයන් නම් කරන්න.

(i) චෝලි: ……………………………………………………………

(ii) ඔට්ටියානම් :……………………………………………………

**44.** කිරි මඩුව ශාන්තිකර්මයේ දී පුද ලබන ප්‍රධාන දෙවියා සහ එය පැවැත්වීමේ ප්‍රධාන අරමුණ සඳහන් කරන්න.

(i) ප්‍රධාන දෙවියා: ……………………………………………………

(ii) ප්‍රධාන අරමුණ :……………………………………………………

**45.** යූ. වී. ලයිට් (Ultra Violet Lamp) මගින් විහිදුවන ආලෝකයට ප්‍රතිචාර දක්වන වර්ණය හා ආලෝකයේ තීව්‍රතාව පාලනය කරන උපකරණය දක්වන්න.

(i) වර්ණය: ……………………………………………………………

(ii) උපකරණය :…………………………………………………………

- අංක **46** සිට **47** තෙක් ප්‍රශ්නවලට පහත දැක්වෙන රූප ඇසුරෙන් පිළිතුරු සපයන්න.

**A**



**B**



**C**



**D**



**46.** ඉහත **A** සහ **B** රූපවලින් දක්වා ඇති රංග වස්ත්‍රාභරණ නම් කරන්න.

(i) **A** රූපය :…………………………………………………………

(ii) **B** රූපය :…………………………………………………………

**47.** ඉහත **C** සහ **D** රූපවලින් නිරූපිත නර්තන සම්ප්‍රදායයන් නම් කරන්න.

(i) **C** රූපය :…………………………………………………………

(ii) **D** රූපය :…………………………………………………………

**48.** "රේණු දොඩම් දෙහි ඇඹුලුයි ගාන්නේ
දෝණු හරින ලෙස වරලස මුදන්නේ"

මෙම කවිය අයත්වන පෙළපාළි අංගය සහ එමගින් නිරූපණය වන චරිතය ලියා දක්වන්න.

(i) පෙළපාළි අංගය :……………………………………………………

(ii) චරිතය :………………………………………………………………

**49.** ලක්දිව, බලියාගය බෞද්ධ මුහුණුවරකින් ස්ථාපිත කරලීමට පුරෝගාමී වූ හිමිවරුන් **දෙදෙනකු** සඳහන් කරන්න.

(i) ………………………………………………………………………

(ii) ………………………………………………………………………

**50.** සෞන්දර්ය අධ්‍යයන ආයතනය, කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ වූ වර්ෂය සහ එය ස්වාධීන විශ්වවිද්‍යාලයක් බවට ස්ථාපිත වූ වර්ෂය සඳහන් කරන්න.

(i) කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ වූ වර්ෂය: ……………………

(ii) ස්වාධීන විශ්වවිද්‍යාලයක් බවට ස්ථාපිත වූ වර්ෂය :………………

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2019

## නව නිර්දේශය/ புதிய பாடத்திட்டம்

විෂය අංකය பாட இலக்கம் 52 විෂයය பாடம் නර්තනය (දේශීය)

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்

## I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|
| 01. | 3 | 11. | 2 | 21. | 2 |
| 02. | 1 | 12. | 4 | 22. | 1 |
| 03. | 5 | 13. | 3 | 23. | 4 |
| 04. | 2 | 14. | 5 | 24. | 4 |
| 05. | 3 | 15. | 2 | 25. | 3 |
| 06. | 3 | 16. | 1 | | |
| 07. | 4 | 17. | 4 | | |
| 08. | 1 | 18. | 2 | | |
| 09. | 1 | 19. | 3 | | |
| 10. | 5 | 20. | 5 | | |

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 02 ලකුණු බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 2 × 25 = 50

## I පත්‍රය

26. සන්නියකුම / දහඅට සන්නිය

27. ව්‍යාභිචාරි

28. 14 වෙනි ලුවී

29. රටයකුම / රිද්දියාගය

30. උඩැක්කිය

31. 2 + 3 තාලය / සුළු මැදුම්

32. කථක්

33. ලෝක ධර්මී

34. කවිකාර මඩුවේ

35. හද්දා වලියකුම/වලියකුම/වලියක් මංගල්‍යය

36. i. ජස/ජසයා/පේඩිරාළ/පේඩි විදානෙ ii. කෝලම්

37. i. සබරගමු ii. තුන්සුළු දෙමහ පස්තිත /<br>2 + 2 + 2 + 4 + 4 පස්තිත /<br>2 + 2 + 2 + 4 + 4 තාලය

38. i. සැළලිහිණිය ii. කෝට්ටේ

39. i. මාරියස් පෙටීපා ii. පීටර් චෙයිකොව්ස්කි

40. i. එකතැන රැඳෙමින් කරන චලන ii. ගමන් කරමින් කරන චලන

41. i. අභිමාන යකා/අභිමානා ii. සූනියම් යක්ෂණිය

42. i. 16 ii. 24

43. i. කථක් ii. භරත

44. i. මංගර ii. ගවපට්ටි සංරක්ෂණය

45. i. සුදු ii. ඩිමරය / ඩිමර්

46. i. කෙයිමෙත්ත ii. කාඟුල / කාඟුල් තොප්පිය

47. i. භරත ii. බැලේ

48. i. නානුමුරය/දොළහ පෙළපාලිය ii. රිද්දි බිසව්

49. i. වීදාගම මෛත්‍රී හිමි ii. තොටගමුවේ ශ්‍රී රාහුල හිමි

50. i. 1974 ii. 2005

*ප්‍රශ්න අංක 01 - 25 දක්වා* **(02 x 25)** *ලකුණු 50*

*ප්‍රශ්න අංක 26 - 50 දක්වා* **(02 x 25)** *ලකුණු 50*

*මුළු ලකුණු 100*

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

නර්තනය - (දේශීය) II
நடனம் - (தேசிய) II
Dancing - (Indigenous) II

52 S II

2019.08.08 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස්:**

* මෙම ප්‍රශ්න පත්‍රය **I, II** හා **III** වශයෙන් කොටස් **තුනකින්** සමන්විත වේ.
* **I** කොටසේ **1** හා **2** ප්‍රශ්න අනිවාර්ය වේ.
* **II** හා **III** කොටස්වලින් අවම වශයෙන් **එක්** ප්‍රශ්නය බැගින් හෝ තෝරාගෙන, අනිවාර්ය ප්‍රශ්න **දෙක** ද ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සැපයිය යුතු ය.
* සෑම ප්‍රශ්නයකම **(i)** කොටසට ලකුණු **06**ක් ද **(ii)** කොටසට ලකුණු **06**ක් ද **(iii)** කොටසට ලකුණු **08**ක් ද වශයෙන් මුළු ලකුණු **20**ක් බැගින් හිමි වේ.

## I කොටස

**1.** (i) පහත සඳහන් කවි පදය මහ තනි තිතට අනුව ප්‍රස්තාර කරන්න.

"ඉන්ද්‍ර දිසාවට ඉඹුල් විමානෙට ඉරු දෙවි අධිපති වන්නේ"

(ii) සුරපති වන්නමේ අඩව්ව හෝ ග්‍රහදණ්ඩ තාලය සින්දු වන්නමේ ඉරට්ටිය හෝ මේඝ වන්නමේ අඩව්ව හෝ නිවැරදි තාල රූපයට අනුව ප්‍රස්තාර කරන්න.

(iii) මංගලම් නර්තනයට අදාළ කස්තිරම තුන්සුළු දෙමහ පස්තිතට අනුව ප්‍රස්තාර කරන්න.

**2.** දේශීය නර්තන කලාව විකාශනය වීමේ දී රාජ්‍ය අනුග්‍රහය මෙන් ම භාරතීය සංස්කෘතික ලක්ෂණ ද බලපා ඇති බව මූලාශ්‍රය මගින් හෙළි වේ.

(i) ගම්පළ යුගයේ දී නර්තන කලාවට බලපෑ භාරතීය ආභාසය කෙබඳු දැයි සාධක **දෙකක්** මගින් පෙන්වා දෙන්න.

(ii) දඹදෙණි හා කුරුණෑගල යුගවල භාවිත වාද්‍ය භාණ්ඩ පිළිබඳ තොරතුරු සාහිත්‍යය මූලාශ්‍රය **දෙකක්** ඇසුරෙන් දක්වන්න.

(iii) 1970 දශකයේ නර්තන කලා අධ්‍යාපනයේ ප්‍රවර්ධනයට ලැබුණු රාජ්‍ය අනුග්‍රහය සාධක **හතරක්** ඇසුරෙන් විමසන්න.

## II කොටස

**3.** දේශීය ශාන්තිකර්මවල ඒ ඒ නර්තන සම්ප්‍රදායන්ට ආවේණික ලක්ෂණ මෙන් ම සමාන ලක්ෂණ ද විද්‍යමාන වේ.

(i) 'වලියක් මංගල්‍යය' හා බැඳුණු චාරිත්‍ර විධි **දෙකක්** නම් කර, එහි අනන්‍යතා ලක්ෂණ පිළිබඳ සාකච්ඡා කරන්න.

(ii) 'රටයකුම' ශාන්තිකර්මය පැවැත්වීමේ අරමුණු පැහැදිලි කර, එහි 'දරු නැළවිල්ල' පෙළපාළි අංගය පිළිබඳ විග්‍රහයක් කරන්න.

(iii) 'කිරි මඩුව' ශාන්තිකර්මයෙහි ආවේණික ලක්ෂණ, එහි නාට්‍යමය පෙළපාළි **දෙකක්** ඇසුරෙන් ඇගයීමක් කරන්න.

**4.** සිංහල ශාන්තිකර්මවල අභිමතාර්ථ ඉටුකර ගැනීමේ දී උපත් කතා, නාට්‍යමය පෙළපාළි හා සැරසිලි ක්‍රම උපයෝගී කොට ගෙන තිබේ.

(i) 'වෛරය නිසා ඇති වන සමාජ ව්‍යසනයන්' පිළිබඳ සන්නියකුම ශාන්තිකර්මයේ උපත් කතාවක් ඇසුරෙන් විමසුමට ලක් කරන්න.

(ii) 'ඌරා යක්කමේ' හෝ 'පොත්කඩේ යක්කමේ' හෝ චරිත නිරූපණය විචාරයට ලක් කරන්න.

(iii) බලි ශාන්තිකර්මයෙහි දක්නට ලැබෙන ඇඹුම් ශිල්පක්‍රම, වර්ණ ගැන්වීම්, සැරසිලි හා අමුද්‍රව්‍යවල සුවිශේෂත්වය පිළිබඳ විග්‍රහයක් කරන්න.

**5.** ගැමි නැටුම් හා ගැමි නාටකවලින් ආගමික, සමාජ හා සංස්කෘතික ජීවන රටාව පිළිබිඹු වේ.

(i) ගැමි නැටුම්වලට අදාළ ගායනා **දෙකක්** මගින් ගැමි ඇදහිලි හා විශ්වාස පිළිබඳ පැහැදිලි කරන්න.

(ii) 'ගැමි නැටුම්වලින් සමාජ සහයෝගිතාව මෙන් ම සාරධර්ම සංවර්ධනය කෙරේ.' විමසන්න.

(iii) 'ජස හා මුදලි චරිත නිරූපණවලින් තත්කාලීන සමාජ අත්දැකීම් විවරණය කරයි.' මෙම ප්‍රකාශය පිළිබඳ අදහස් දක්වන්න.

## III කොටස

**6.** පහත සඳහන් වගුවෙහි **(අ)**, **(ආ)** සහ **(ඉ)** යන කොටස්වලට අදාළ ව අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| **(අ) කොටස** | **(ආ) කොටස** | **(ඉ) කොටස** |
|---|---|---|
| පරන් | XIV ලුවී රජ | පටාචාරා |
| වර්ණම් | මහා පීටර් රජ | නට් ක්‍රැකර් |
| ඨුම්රි | III හෙන්රි රජ | නිදි කුමරිය |
| තරානා | VIII හෙන්රි රජ | බැරිසිල් |

(i) **(අ)** කොටස - භරත නාට්‍යම් නර්තන සම්ප්‍රදායට අයත් නර්තන අංගය තෝරා එහි සුවිශේෂ ලක්ෂණ විස්තර කරන්න.

(ii) **(ආ)** කොටස - රුසියාවේ බැලේ රංග කලාවට අනුග්‍රහය ලබා දුන් රජ නම් කර, ඔහුගෙන් සිදු වූ සේවය අගයන්න.

(iii) **(ඉ)** කොටස - ඔබ කැමති දේශීය මුද්‍රා නාට්‍යයක් තෝරාගෙන එහි කතා පුවත, සංගීත නිර්මාණය සහ රංග වින්‍යාසය පිළිබඳ විමසීමක් කරන්න.

**7.** ප්‍රාසංගික නර්තනයේ ප්‍රගමනයට පෙරදිග හා අපරදිග නර්තන ප්‍රවණතා බෙහෙවින් බලපා ඇත.

(i) නව නර්තනය බිහි වීම සඳහා අද්‍යතන සමාජ රුචිකත්වය බලපා ඇති ආකාරය ඉහත පාඨය ඇසුරෙන් විමසන්න.

(ii) දේශීය නව නර්තන ප්‍රවණතා කෙරෙහි ජන සන්නිවේදන මාධ්‍ය බලපා ඇති අයුරු සාකච්ඡා කරන්න.

(iii) ප්‍රාසංගික නර්තන නිර්මාණකරණය සඳහා සංගීතය, රංග වස්ත්‍රාභරණ, අංග රචනය සහ ආලෝකකරණය යොදා ගැනීමේ දී ඖචිත්‍ය බව වැදගත් වේ. ඔබගේ අදහස් දක්වන්න.

**8.** ආනුෂංගික කලා භාවිතයේ සුවිශේෂත්වය නිසා අද්‍යතන ප්‍රසංගික නර්තන නිර්මාණකරණයට ද ප්‍රමුඛත්වයක් හිමි වී ඇත.

(i) චිත්‍ර කලාවේ මූලිකාංග, නර්තන කලාව හා බැඳෙන ආකාරය උදාහරණ සහිත ව දක්වන්න.

(ii) චරිතාංග අංගරචනය යනු කුමක් දැයි පැහැදිලි කරන්න.

(iii) රංග භූමිය හා නූතන වේදිකාව අර්ථ කථනය කොට පින්තූර රාමු වේදිකාවේ සුවිශේෂ ලක්ෂණ විග්‍රහ කරන්න.

* * *

## I කොටස

01.

(i) **පහත සඳහන් කවි පදය මහ තනි තිතට අනුව ප්‍රස්තාර කරන්න.**

**''ඉන්ද්‍ර දිසාවට ඉඹුල් විමානෙට ඉරුදෙවි අධිපති වන්නේ''**

| / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| + | ඉන් | ද්‍ර | දි | සා | - | ව | ට | - | ඉඹු | ල් | වි | මා | - | නෙ | ට |
| + | ඉරු | දෙ | වි | අ | ධි | ප | ති | - | වන් | නේ | - | - | - | - | - |

මෙම ගායනය පහත ආකාරයට ද ඉදිරිපත් කළ හැකිය.

| / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| + | + | ඉන් | - | ද්‍ර | - | දි | - | සා | - | - | - | ව | - | ට | - |
| + | + | ඉ | ඹු | ල් | - | වි | - | මා | - | - | - | නෙ | - | ට | - |
| + | + | ඉ | රු | දෙ | - | වි | - | අ | - | ධි | - | ප | - | ති | - |
| + | + | වන් | - | නේ | - | - | - | - | - | - | - | - | - | - | - |

*නිවැරදි විභාග වලට වෙන්කිරීම හා සංකේත භාවිතයට ලකුණු 02*
*කවිපද නිවැරදිව ප්‍රස්ථාර කිරීමට ලකුණු 04*
*මුළු ලකුණු 06*

(ii) **සුරපති වන්නමේ අඩව්ව හෝ ග්‍රහදණ්ඩ තාලය සින්දුවන්නමේ ඉරට්ටිය හෝ මේෂ වන්නමේ අඩව්ව හෝ නිවැරදි තාලරූපයට අනුව ප්‍රස්තාර කරන්න.**

සුරපති වන්නමේ අඩව්ව

| ^ 1 | 2 | 3 | / 1 | 2 | 3 | 4 | ^ 1 | 2 | 3 | / 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| තත් | - | ත | ත | රි | ත | රි | ත | ත | රි | ත | රි | ත | රි |
| රු | ඳ | ග | ජි | මි | ජි | මි | ති | තිත් | - | තෙයි | - | - | - |
| ති | තිත් | - | තෙයි | - | - | - | ති | තිත් | - | තෙයි | - | - | - |
| ත | තත් | - | ජිත් | - | ජිත් | - | තො | තොං | - | නං | - | නං | - |
| රු | ඳ | ග | ජි | මි | ජි | මි | ති | තිත් | - | තෙයි | | | |

ග්‍රහදණ්ඩ තාලය සිංදු වන්නමේ ඉරට්ටිය

| ^ | | | / | | | | ^ | | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 |
| දොම් | - | ග | දිත් | - | තත් | - | ග | දි | ත | ගුහි | තිග | දිරි | කිට |
| දෙ | ග | ත | ගු | ඥ | ග | ත | ග | ත | කු | දොම් | - | ගදි | ගත |
| දොම් | - | ත | දොම් | - | ග | ත | ග | දි | ත | ගුහි | තිග | දිරි | කිට |
| තා | - | - | දොම් | - | ග | ත | ග | දි | ත | ගු | ඥි | ගු | ඥ |
| තා | | | | | | | | | | | | | |

මේඝ වන්නමේ අඩව්ව

| ^ | | | / | | | | ^ | | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 |
| ජිං | - | ත | ග | ත | ග | ත | ග | ති | ත | ග | ත | ග | ත |
| ග | ජිං | - | ගත් | - | තත් | - | ග | තත් | - | ජෙං | - | ජෙං | - |
| ග | තත් | - | කුං | - | දිං | - | ග | තත් | - | කුං | - | දිං | - |
| ග | තත් | - | කුං | - | දිං | - | ග | තත් | - | කු | ඥ | කු | ඥ |
| දොං | - | ත | කුන් | දත් | තරි | කිට | ග | තත් | - | කු | ඥ | ග | ත |
| තා | - | - | ගත් | - | තත් | - | ග | තත් | - | කු | ඥ | ග | ත |
| තා | | | | | | | | | | | | | |

හෝ

| ^ | | | / | | | | ^ | | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 |
| ජිං | - | ත | ග | ත | ග | ත | ජි | ග | ත | ග | ත | ග | ත |
| ග | ජිං | - | ගත් | - | තත් | - | ග | තත් | - | ජෙං | - | ජෙං | - |
| ග | ජිං | - | ගත් | - | තත් | - | ග | ජිං | - | ගත් | - | තත් | - |
| ග | ජිං | - | ගත් | - | තත් | - | ග | තත් | - | ජෙං | - | ජෙං | - |
| දොං | - | ත | ගත් | - | තත් | - | ග | තත් | - | කු | ඥ | ග | ත |
| තා | - | - | ගත් | - | තත් | - | ග | තත් | - | කු | ඥ | ග | ත |
| තා | | | | | | | | | | | | | |

*නිවැරදි විභාගවලට වෙන් කිරීම හා සංකේත භාවිතයට ලකුණු 02*

*පද නිවැරදිව ප්‍රස්තාර කිරීමට ලකුණු 04*

*මුළු ලකුණු 06*

(iii) **මංගලම් නර්තනයට අදාළ කස්තිරම තුන් සුළු දෙමහ පස්තිතට ප්‍රස්තාර කරන්න.**

| ^ 1 | 2 | ^ 1 | 2 | ^ 1 | 2 | / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ගත් | - | ජිත් | - | තත් | - | ජිං | - | ත | ක | ත | රි | කි | ට |
| ග | ජිත් | - | කු | ඳත් | - | ජි | කු | ත | ක | ත | රි | කි | ට |
| ග | ත | කු | කු | දත් | - | ජි | කු | ත | ක | ත | රි | කි | ට |
| ග | ත | කු | ඳ | කු | ඳ | තා | - | ත | ක | ත | රි | කි | ට |
| ත | ක | ජිත් | - | තත් | - | ජිං | - | ත | ක | ත | රි | කි | ට |
| ග | ජිත් | - | කු | ඳත් | - | ජි | කු | ත | ක | ත | රි | කි | ට |
| ග | ත | කු | කු | දත් | - | ජි | කු | ත | ක | ත | රි | කි | ට |
| ග | ත | කු | ඳ | කු | ඳ | තා | - | ත | ක | ත | රි | කි | ට |
| ගත් | - | ජිත් | - | තත් | - | ජිං | - | ත | ක | ත | රි | කි | ට |
| ග | ජිත් | - | කු | ඳත් | - | ජි | කු | ත | ක | ත | රි | කි | ට |
| ත | ක | ජිත් | - | තත් | - | ජිං | - | ත | ක | ත | රි | කි | ට |
| ග | ජිත් | - | කු | ඳත් | - | ජි | කු | ත | ක | ත | රි | කි | ට |
| ගත් | - | ජිත් | - | තත් | - | ජිං | - | ත | ක | ත | රි | කි | ට |
| ත | ක | ජිත් | - | තත් | - | ජිං | - | ත | ක | ත | රි | කි | ට |
| ග | ත | කු | කු | දත් | - | ජි | කු | ත | ක | ත | රි | කි | ට |
| ග | ත | කු | ඳ | කු | ඳ | තත් | ජිත් | තොං | නං | තා | | | |

*නිවැරදි විභාගවලට වෙන් කිරීම හා සංකේත භාවිතයට ලකුණු 02*

*පද නිවැරදිව ප්‍රස්තාර කිරීමට ලකුණු 06*

*මුළු ලකුණු 08*

02. **දේශීය නර්තන කලාව විකාශනය වීමේ දී රාජ්‍ය අනුග්‍රහය මෙන්ම භාරතීය සංස්කෘතික ලක්ෂණ ද බලපා ඇති බව මූලාශ්‍රය මගින් හෙළි වේ.**

(i) **ගම්පළ යුගයේදී නර්තන කලාවට බලපෑ භාරතීය ආභාසය කෙබඳු දැයි සාධක දෙකක් මගින් පෙන්වා දෙන්න.**

<u>සාධක</u>

- ඇම්බැක්කේ දේවාලයේ සිවිරුස් පනේලයක දක්නට ඇති නළඟනකගේ ලී කැටයම් හි "මණ්ඩියට නැමී සිටින ඉරියව්වෙහි, වම් අත දණහිස මත ද, දකුණු අතින් හම්සපක්ෂ මුද්‍රාව ද, දැක්වෙන නර්තන විලාසය දකුණු ඉන්දීය ලක්ෂණ පෙන්නුම් කරන බව.
- තිසර සංදේශයේ සඳහන් "තහලම් කල බෙර තම්මැට පටතන්තිරි ඩමුරු" ..... යන කවිය ඇසුරෙන් දක්ෂිණ භාරතීය වාද්‍ය භාණ්ඩ නාමද තිබූ බව.
- ඉබන් බතූතාගේ වාර්තාවට අනුව "දෙවුන්දර උපුල්වන් දේවාල නර්තනය ඉන්දියානු දේවදාසි නර්තන ආභාසයෙන් ලත් නර්තන අංගයක් වූ බව.

*සාධක දෙකකට ලකුණු 02*

*විස්තර කිරීමට ලකුණු 04*

*මුළු ලකුණු 06*

(ii) **දඹදෙණි හා කුරුණෑගල යුගවල භාවිත වාද්‍ය භාණ්ඩ පිළිබඳ තොරතුරු සාහිත්‍ය මූලාශ්‍රය දෙකක් ඇසුරෙන් දක්වන්න.**

- ථූප වංශයෙහි පංචතූර්ය නාද යනුවෙන් හඳුන්වන ආතත, විතත, විතතාතත, ඝන, සුසිර යන වර්ග 5 කට අයත් භාණ්ඩ ලේඛනයක් දක්වා තිබීම.
- කුරුණෑගල යුගයේ ලියවුණු සිංහල ථූප වංශයේ සඳහන් ගැටබෙර, පනාබෙර, එකැස් බෙර, දද්දර, මිහිඟු බෙර, පටහ, ලොහබෙර, තප්පු, තලප්පු, මද්දල භෘංගවීණා, නකුල වීණා .......
- දළදා සිරිතෙහි සඳහන් සත් පකද්ව දළහං, මද්දල, මහමඩුකුඩම්, පනාබෙර, මිහිඟු බෙර, ඩක්කි, උඩැක්කි, තාලම්පට, විරන්දම්, රණරඩග...... යනාදී භාණ්ඩ නාමාවලිය
- උම්මග්ග ජාතකයේ සඳහන් "ඒ වේදේහ රජුගේ විධානයෙන් අතත, විතත, විතතාතත, ඝණ, සුසිර යනාදී පංච වාර්ගික තූර්ය නාද පැවැත්වූහ."
- දඹදෙණි අස්න සඳහන් තවද නිසාන, තම්මැට, දවුල්, ලොහදවුල්, මහදවුල්, ජිනදවුල්, තප්පු, තලප්පු, මහබෙර, ලෝහබෙර, පටාබෙර, එකැස්බෙර, පනාබෙර, ගැටබෙර, පොකුරුබෙර, මිහිඟුබෙර, නාදබෙර,වයනාබෙර, මද්දල, වීරන්දම්, මහුමකුඩම්, අතතය, විතතය, ඝනය, සුසිරය යනාදී බෙරි ඝෝෂාවෙන් සහ සොරණ වීණා, කොම්බු, දාරසක්, දකුණුසක්, විදුරුසක්, රිදීසක්, කරසක්, නාගස්වරම් .......

*මූලාශ්‍රය දෙක - ලකුණු 02*

*මූලාශ්‍රය 2 ක් ඇසුරෙන් තොරතුරු දක්වා තිබීමට ලකුණු 04*

*මුළු ලකුණු 06*

(iii) **1970 දශකයේ නර්තන කලා අධ්‍යාපනයේ ප්‍රවර්ධනයට ලැබුණු රාජ්‍ය අනුග්‍රහය සාධක හතරක් ඇසුරෙන් විමසන්න.**

1972 - අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ පාසල් විෂය මාලාවට සෞන්දර්ය විෂයය අනිවාර්ය කිරීම.

1972 - සෞන්දර්ය ගුරු පුහුණු කිරීම සඳහා ගිරාගම සෞන්දර්ය ගුරු විදුහල ආරම්භ කිරීම.

1974 - රජයේ නැටුම් හා මුද්‍රා නාට්‍ය විද්‍යාලය, ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ සෞන්දර්ය අධ්‍යයන ආයතනය නමින් හැඳින්වීම.

1975 - ජා.පො.අ.ස. විභාගය සඳහා සෞන්දර්ය විෂයයන් යටතේ ප්‍රථම වතාවට නර්තන විෂයට පෙනී සිටීමට අවස්ථාව ලබාදීම.

1976 - අ.පො.ස. (උ.පෙළ) විෂය ධාරාවට, සෞන්දර්ය විෂය ඇතුළත් වීම.

1977 - පෙරදිග සංගීත හා නැටුම් විභාගය, ජාතික නැටුම් සංගීත විභාගය නමින් ප්‍රතිසංවිධානය කිරීම.

1978 - කැලණිය විශ්වවිද්‍යාලයේ, සෞන්දර්ය අධ්‍යයන ආයතනය ප්‍රතිසංවිධානය කිරීම.

1978 - අ.පො.ස. (උ.පෙළ) විභාගයේ නර්තන විෂයය ආරම්භ කිරීම.

***සාධක 04 ක් නම් කිරීමට ලකුණු 04***

***විමසීමට ලකුණු 04***

***මුළු ලකුණු 08***

## II කොටස

**03. දේශීය ශාන්තිකර්මවල ඒ ඒ නර්තන සම්ප්‍රදායන්ට ආවේණික ලක්ෂණ මෙන්ම සමාන ලක්ෂණ ද විද්‍යමාන වේ.**

**(i) වලියක් මංගල්‍යය හා බැඳුණු චාරිත්‍ර විධි දෙකක් නම් කර, එහි අනන්‍යතා ලක්ෂණ පිළිබඳ සාකච්ඡා කරන්න.**

- තේවා වාදනය සමඟ පූජා චාරිත්‍ර ආරම්භ කරන බව.
- පරහඳ ගෑමෙන් පසු වලියක් මංගල්‍ය ආරම්භ කරන බව.
- පළමු දිනයේ සිට සත්වන දිනය දක්වා නියමිත වේලාවන් අනුව තේවා හේවිසි වාදනය ආරම්භ කරන බව.
- ගවර මල වටා මඩුපුරය හා මල්පදය පමණක් නර්තනය කරන බව.
- කොහොඹා කංකාරියේ නාට්‍යමය ලක්ෂණ දැක්වෙන වැදි යක්කම, නයා යක්කම, මහ යක්කම යන පෙළපාලි රඟ දක්වන අතර ඌරා යක්කම රඟ නොදක්වන බව.
- කාලියාම, ගරායකුන් නැටීම, ගුරුගේමාලාව ඇවැන්දුමේ දොඟරො ජිං ගත වට්ටම, කීල බැඳීම, චාරිත්‍ර වශයෙන් ඉදිරිපත් කරන බව.

***චාරිත්‍ර විධි දෙකක් නම් කිරීම ලකුණු 02***
***අනන්‍යතා ලක්ෂණ පිළිබඳ සාකච්ඡා කිරීමට ලකුණු 04***
***මුළු ලකුණු 06***

**(ii) රටයකුම ශාන්තිකර්මය පැවැත්වීමේ අරමුණු පැහැදිලි කර, එහි දරු නැළවිල්ල පෙළපාළි අංගය පිළිබඳ විග්‍රහයක් කරන්න.**

<u>අරමුණු</u>

- ගැබ් ගත් ස්ත්‍රීන් ගේ ගර්භය ආරක්ෂා කරගැනීම සහ දරුපල නැති ස්ත්‍රීන්හට දරු ගැබ් අපේක්ෂාවෙන් කරනු ලබන ගර්භ සංරක්ෂණ ශාන්තිකර්මයක් බව.

<u>දරු නැළවිල්ල</u>

- රටයකුම ශාන්තිකර්මයේ අන්තර්ගත නාට්‍යමය පෙළපාලියක් බව.
- කාන්තා වෙස්ගත් ඇදුරා ස්ත්‍රී ලාලිත්‍ය ඔප් නැංවෙන පරිදි කවි කියමින් දරුවා නැලවීම, නැහැවීම, කිරිදීම වැනි දරු සෙනෙහසේ භාවමය ලක්ෂණ නාට්‍යානුසාරයෙන් රඟ දක්වන බව.
- දරුපල අපේක්ෂාවෙන් සිටින කාන්තාවන්ගේ භාවාත්මක හැඟීම් අවදි කරන බව.
- කාන්තාවකගේ මානසික තත්ත්වය චිකිත්සාවට ලක්වන බව.

***අරමුණු පැහැදිලි කිරීමට ලකුණු 02***
***පෙළපාලි අංගය විස්තර කිරීමට ලකුණු 04***
***මුළු ලකුණු 06***

(iii) **'කිරිමඩුව' ශාන්තිකර්මයෙහි ආවේණික ලක්ෂණ එහි නාට්‍යමය පෙළපාළි <u>දෙකක්</u> ඇසුරෙන් ඇගයීමක් කරන්න.**

- සබරගමු නර්තන සම්ප්‍රදායේ ගව පට්ටි සංරක්ෂණය සඳහා කරනු ලබන ශාන්තිකර්මයක් බව.
- නාට්‍යමය පෙළපාළි ලෙස නුගේ හෑල්ල, මී කැඩීම, ඇත් බන්ධනය හා මී බන්ධනය සිදු කෙරෙන බව.
- සම්ප්‍රදායික අනන්‍යතා ලක්ෂණ,
  රංග සැරසිලි, රංග උපකරණ,
  නාට්‍යමය රංගන අවස්ථා තුළ ඇති ග්‍රාම්‍ය ලක්ෂණ පෙන්නුම් කරන බව.

*නාට්‍යමය පෙළපාළි නම් කිරීමට ලකුණු 02*
*ආවේනික ලක්ෂණ විස්තර කිරීමට ලකුණු 06*
*මුළු ලකුණු 08*

04. **සිංහල ශාන්තිකර්මවල අභිමතාර්ථ ඉටුකරගැනීමේදී උපත්කථා, නාට්‍යමය පෙළපාළි හා සැරසිලි ක්‍රම උපයෝගී කොටගෙන තිබේ.**

(i) **"වෛරය නිසා ඇතිවන සමාජ ව්‍යසනයන් '' පිළිබඳ සන්නියකුම ශාන්තිකර්මයේ උපත් කතාවක් ඇසුරෙන් විමසුමට ලක් කරන්න.**

- සන්නියකුමේ <u>සංඛපාල කතාව</u> හෝ <u>දුං උදියාගේ</u> කතාව ඇසුරෙන් නිදසුන් සහිතව සනාථ කළ හැකි බව.
- වෛරය, ක්‍රෝධය, පළිගැනීම, බොරුකීම, කේලම් කීම වැනි අයහපත් ක්‍රියාවල ප්‍රතිඵල ලෙස - පවුල් සංස්ථාව බිඳ වැටීම
  - මාතෘත්වයේ මානසික අසහන තත්ත්වයක් ඇති වීම.
  - මාපිය සෙනෙහස අහිමිවීමෙන් ඇතිවන පල විපාක.

*උපත් කථාවට ලකුණු 02*
*විමසුමට ලක්කිරීමට ලකුණු 04*
*මුළු ලකුණු 06*

(ii) **"උඟුරා යක්කමේ'' හෝ ''පොත්කඩේ යක්කමේ'' හෝ චරිත නිරූපණය විචාරයට ලක් කරන්න.**

<u>උඟුරා යක්කම</u>

- කොහොඹා කංකාරියේ යක්කම් 5 ට ඇතුළත් නාට්‍යමය අවස්ථාවක් බව.
- කංකාරි උපත් කථාවෙහි දැක්වෙන මලය රජුගේ උයන විනාශ කළ පුවතට සම්බන්ධවන බව.
- හාස්‍ය මුසුවන දෙබස්, උපහාසාත්මක කවි මගින් චරිත නිරූපණය කරන බව.
  උදා - • තෙමාලා රෙද්ද හැළියේ ඔබන කොට.......
  • කපාලා දෙමුය ගම මහගෙ බරට ගාතයක් .......
- චරිත නිරූපණයේදී වෙස් ඇඳුමෙන් සැරසුණු යක්දෙස්සා බෙරකරු සමඟ ඔබමොබ යමින් සංවාදයේ යෙදෙන බව.
- කෙසෙල්බඩ, ලී කෝටු යොදාගනිමින් සකසා ඇති උඟුරාගේ අනුරුවක් රංග භූමියෙහි තැබීමේ පරමාර්ථය.

- වාචික අභිනය ප්‍රධාන කොට, ආංගික, සාත්වික අභිනයන් අඩුවැඩි වශයෙන් යොදා ගෙන ඇති බව.
- හාස්‍ය රසය දැනවීම සඳහා ප්‍රේක්ෂකයන් වෙතට ව්‍යංගාර්ථ සපයමින් නාට්‍යමය ලක්ෂණ පෙන්නුම් කරන බව.

<u>පොත්කඩේ යක්කම</u>

- පොත්කඩේ පාළිය, පොත්-කඩේ යක්කම, පොත්කඩේ යක්කම, පොක්කඩේ නමින්ද හඳුන්වන බව.
- සබරගමු ශාන්තිකර්මවලට ආවේණික පෙළපාලියක් බව.
- සුදු රෙදිකඩ මත තැබූ බුලත් හුරුල්ල මෙනමින් හඳුන්වන බව.
- පහන්මඩු ශාන්තිකර්මයේ හත්පද පෙළපාලියේ, දළුමුර පෙළපාලියට ප්‍රථම ඉදිරිපත් කෙරෙන පෙළපාලියක් බව.
- වාචික අභිනය ප්‍රධාන කොට ආංගික, සාත්වික අභින අඩුවැඩි වශයෙන් යොදා ගෙන ඇති බව.
- නෙල්ලිකොත්තුවා හෙවත් අතෝරකරු රංගන කාර්යයට දායක වුවත් සංවාද සඳහා සහභාගී කොට නොගන්නා බව.
- හාස්‍ය රසය දැනවීම සඳහා ප්‍රේක්ෂකයා වෙතට ව්‍යංගාර්ථ සපයමින් නාට්‍යමය ලක්ෂණ පෙන්නුම් කරන බව.

***චරිත නිරූපන විචාරයට ලක්කර තිබීමට ලකුණු 06***

(iii) **බලි ශාන්තිකර්මයෙහි දක්නට ලැබෙන ඇඹුම් ශිල්පක්‍රම, වර්ණ ගැන්වීම, සැරසිලි හා අමුද්‍රව්‍යවල සුවිශේෂත්වය පිළිබඳ විග්‍රහයක් කරන්න.**

- ඇඹුම් ශිල්ප ක්‍රම
  - උතුරින් ඇති තුඹසකින් හුඹස් මැටි ගන්නා බව.
  - සඳුන් කිරි පැන් ඉස මැටි පේ කරගන්නා බව.
  - නේත්‍රා තැබීම සිදුකරන බව.
- වර්ණ ගැන්වීම
  - ස්වභාවිකව යොදාගන්නා අමුද්‍රව්‍ය භාවිතා කරමින් බලි වර්ණ ගන්වන බව.
  - පොල් කටු අඟුරු, ගුරු ගල්, කොළ යුෂ, කිරිමැටි, කහ කුඩු, නිල් කුඩු වැනි ද්‍රව්‍ය භාවිතා කරන බව.
- සැරසිලි හා අමුද්‍රව්‍ය
  - බලි මඩුව හා මැස්ස තැනීම.
  - අටමගල තැනීම.
  - මල් බුලත් පුටුව සැකසීම.
  - කෙසෙල් පතුරු, හබරල කොළ, ගොප් කොළ, වර්ණවත් මල් වර්ග ......

***ඉහත කරුණු ඇසුරින් විග්‍රහ කර තිබීමට ලකුණු 08***

05. **ගැමි නැටුම් හා ගැමි නාටකවලින් ආගමික, සමාජ හා සංස්කෘතික ජීවන රටාව පිළිබිඹු වේ.**

(i) **ගැමි නැටුම්වලට අදාළ ගායනා 2 ක් මගින් ගැමි ඇදහිලි හා විශ්වාස පිළිබඳ පැහැදිලි කරන්න.**

- ගැමි ඇදහිලි හා විශ්වාස මත ගැමි ගායනා නිර්මාණය වී ඇති බව.
  - වරම් වරම් ඉරසඳදෙවි අනින් වරම් ......
  - මල් මාලා සොඳ වරම් ලබනවා ......
  - බෝ අත්තට වැඳ සිරස නමන්නේ .......
  - හිරු දෙවියන්ගේ ඉර ගල ගාවා......

***ඉහත උදාහරණ හෝ වෙනත් අදාළ කවි දෙකක් ලියා තිබීමට ලකුණු 02***
***එම කවි ඇසුරෙන් ඇදහිලි හා විශ්වාස පිළිබඳ විස්තර කිරීමට ලකුණු 04***
***මුළු ලකුණු 06***

(ii) **"ගැමි නැටුම්වලින් සමාජ සහයෝගීතාව මෙන්ම සාරධර්ම සංවර්ධනය කෙරේ.'' විමසන්න**

- සමාජ සහයෝගීතාවය දක්වා ඇති ගායනා උදාහරණයට ගෙන තිබීම.
  - උඩහ ගෙදර රන්කිරි නංගිලත් ඇවිල්ලා .......
  - අක්කන්ඩියේ යමු අපි පන් නෙලන්නට ......
  - ජේළි ගැසී අඟනෝ සැරසීලා .......
  - බෝගම්බර අපි නෙළුමට යනකොට තිස්දෙන්නෙක් නෙලතෙයි තානම් ......
- දේව ඇදහිලි හා විශ්වාස මත සාරධර්ම සංවර්ධනය වන බව.
- ප්‍රාදේශීය වශයෙන් පුද ලබන දෙවිවරු පිළිබඳ කවි ගායනා වලින් සාරධර්ම සංවර්ධනය වී ඇති බව.

***ඉහත කරුණු ඇසුරෙන් විමසා තිබීමට ලකුණු 06***

(iii) **"ජස හා මුදලි චරිත නිරූපණවලින් තත්කාලීන සමාජ අත්දැකීම් විවරණය කරයි.'' මෙම ප්‍රකාශය පිළිබඳ අදහස් දක්වන්න.**

- අව්‍යාජත්වය චරිත තුළ දක්නට ඇති බව.
- රංගවස්ත්‍ර හා වෙස් මුහුණුවලින් චරිත ස්වභාවය තීව්‍ර කර දැක්වෙන බව.
- ජස හා මුදලි චරිත මගින් ඔවුන්ගේ ක්‍රියා කලාපයන් හාස්‍යයට, උපහාසයට ලක්කර ඇති බව.

  උදා - බීමත්කම, සුරාව, පවුල් සංස්ථාව තුළ ඇති නොසන්සුන් කම, අඹුසැමි ආරවුල්, රාජකාරිය පැහැරහැරීම, අල්ලස පිළිබඳ සමාජ විවරණයක් ඇති බව.
- තමාට හිමි වගකීම් හා වගවීම් තේරුම් නොගන්නා බව.
- එම චරිත ස්වභාවයන්ට අනුකූල නර්තන, ගායන, වාදන අංගයන්ගේ සහසම්බන්ධතාවය මනාව නිරූපණය කිරීම හා එමගින් ප්‍රේක්ෂකයන්ට වින්දනය හා පණිවිඩයක් ලබාදෙන බව.
- රංග වස්ත්‍රාභරණ, වෙස් මුහුණු රංග භාණ්ඩ සතර අභිනය මතුකරලීමට පිටිවහලක් වී ඇති බව.

***ඉහත කරුණු ඇසුරෙන් සමාජ අත්දැකීම් විවරණය කර තිබීමට ලකුණු 08***

## III කොටස

**06. පහත සඳහන් වගුවෙහි (අ), (ආ) සහ (ඉ) යන කොටස්වලට අදාළ ව අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(i) **(අ) කොටස - භරත නාට්‍යයම් නර්තන සම්ප්‍රදායට අයත් නර්තන අංගය තෝරා එහි සුවිශේෂ ලක්ෂණ විස්තර කරන්න.**

<u>වර්ණම්</u>

- දීර්ඝතම, අසීරුවූත් නර්තන අංගයක් බව.
- නෘත්ත, නෘත්‍ය චලන ලක්ෂණ වලින් සමන්විත බව.
- භරත නර්තන ශිල්පියාගේ හෝ ශිල්පිනියගේ හෝ දක්ෂතාවය මැන බැලීමට හැකි බව.
- භාව ප්‍රකාශනයන්, අංගචලන වල ශුද්ධ බව, සංකීර්ණ ලය, තාල මත පිහිටා ඇති බව.
- ශ්‍රම ශක්තිය, දරාගැනීමේ හැකියාව, නර්තනයේ ගැඹුරු බව වර්ණම් වලින් ප්‍රකට වන බව.
- ශිව, පාර්වතී, ක්‍රිෂ්ණා, රාමා, සීතා වැනි දේව චරිත වර්ණනා කොට භක්තිය ප්‍රකාශ කරන බව.

*නර්තන අංගය නම් කිරීමට ලකුණු 02*
*සුවිශේෂ ලක්ෂණ විස්තර කිරීමට ලකුණු 04*
*මුළු ලකුණු 06*

(ii) **(ආ) කොටස - රුසියාවේ බැලේ රංග කලාවට අනුග්‍රහය ලබාදුන් රජ නම් කර, ඔහුගෙන් සිදු වූ සේවය අගයන්න.**

<u>මහා පීටර් රජු</u>

- ක්‍රි.ව. 1672 ජුනි 09 දින මොස්කව්හි දී උපත ලැබූ බව.
- Pytor Alexeyovich Romanov - පීටර් ඇලෙක්ෂියෝවිච් රොමානොව් නම් ඔහු මහා පීටර් නමින් රුසියාවේ රාජ්‍ය පාලකයා වූ බව.
- ඔහු දෙවතාවක් යුරෝපයේ සංචාරය කිරීමෙන් පසුව පළමුවරට බැලේ රංගකලාව රුසියාවට හඳුන්වා දුන් බව.
- කලාකරුවන්ට ඉතා ඉහළ වැටුපක් ලබාදීම සහ තරුණ කලාකරුවන් යුරෝපා රටවල සංචාරය සඳහා යැවූ බව.
- ශාන්ත පීටර්ස්බර්ග් නගරය ප්‍රතිසංස්කරණය කර අගනගරය බවට පත්කිරීමෙන් පසු රුසියාවේ ප්‍රථම බැලේ රංග පාසල වන ඉම්පිරියල් බැලේ පාසල ස්ථාපිත කිරීම සඳහා අනුග්‍රහය ලබාදුන් බව.

*නම් කිරීමට ලකුණු 02*
*සේවය අගය කර තිබීමට ලකුණු 04*
*මුළු ලකුණු 06*

(iii) **(ඉ) කොටස - ඔබ කැමති දේශීය මුද්‍රා නාට්‍යයක් තෝරාගෙන එහි කථා පුවත, සංගීත නිර්මාණය සහ රංග වින්‍යාසය පිළිබඳ විමසීමක් කරන්න.**

පටාචාරා / බැරිසිල්

- තේමාවට අදාළ කථාපුවත ලියා තිබේ නම්.
- සංගීත නිර්මාණයේ දී විවිධ සංගීත කණ්ඩ, නාදමාලා භාවිත කර ඇති බව.
- සංගීත නිර්මාණයේ උචිත බව.
- තාක්‍ෂණික උපක්‍රම, රංගාලෝක ආදිය නිසා ප්‍රාසංගික අත්දැකීමක් කරා ප්‍රේක්‍ෂකයන් යොමුකර ඇති බව.
- නර්තන වින්‍යාසය යොදාගෙන ඇති ආකාරය පැහැදිලි කළ යුතු බව.
- රංග වින්‍යාසයේ දී මාලිගාවක්, ආශ්‍රමයක් ලෙස තාක්‍ෂණික ක්‍රම උපයෝගී කරගෙන ඇති බව.
- පසුතළ නිර්මාණයන්ගේ උපයෝගීතාවය ඇති බව.

*මුද්‍රා නාට්‍ය නම් කිරීමට ලකුණු 02*

*කථා පුවත, සංගීත නිර්මාණය හා රංග වින්‍යාසය විස්තර කර තිබීමට ලකුණු 06*

*මුළු ලකුණු 08*

07. **ප්‍රාසංගික නර්තනයේ ප්‍රගමනයට පෙරදිග හා අපරදිග නර්තන ප්‍රවණතා බෙහෙවින් බලපා ඇත.**

(i) **නව නර්තනය බිහිවීම සඳහා අද්‍යතන සමාජ රුචිකත්වය බලපා ඇති ආකාරය ඉහත පාඨය ඇසුරෙන් විමසන්න.**

- ගෝලීයකරණය හා තාක්‍ෂණික දියුණුව නිසා නර්තනය පිළිබඳව තොරතුරු විසරණය වන බව.
- පාරම්පරික මතවාද බිඳවැටීම හා කාන්තාවන් නර්තනයට පිවිස ඇති බව.
- විවිධ ආයතන හා නර්තන කණ්ඩායම් බිහිවී ඇති බව.
  - සංස්කෘතික මධ්‍යස්ථාන, ජාතික තරුණ සේවා සභාවේ බෙල්වුඩ් ආයතනය, ත්‍රිවිධ හමුදා හා පොලිස් නර්තන කණ්ඩායම්, රාජ්‍ය පළාත් නර්තන කණ්ඩායම්
- විවිධ උත්සව සඳහා විවිධ තේමාවන් ඔස්සේ නර්තන නිර්මාණයට පෙළඹී ඇති බව.
  - මංගල උත්සව, පිළිගැනීමේ උත්සව, සමාරම්භක උත්සව හා විවිධ පෙරහැර
- සාම්ප්‍රදායික අරමුණුවලින් බැහැරව නූතන අවශ්‍යතා අනුව නර්තන නිර්මාණ බිහි වී ඇති බව.
- සංගීත සංදර්ශන සඳහා විවිධ නර්තන ඉදිරිපත් කර ඇති බව.
- නර්තන නිර්මාණකරනයේ දී විදේශීය ආභාසය ගෙන ඇති බව.

*ඉහත පාඨය ඇසුරෙන් විමසා තිබීමට ලකුණු 06*

(ii) **දේශීය නව නර්තන ප්‍රවණතා කෙරෙහි ජන සන්නිවේදන මාධ්‍ය බලපා ඇති අයුරු සාකච්ඡා කරන්න.**

- ශ්‍රී ලංකාවේ පැවැත්වෙන ශාන්තිකර්ම පිළිබඳ විචාරාත්මක නර්තන වැඩසටහන්, ප්‍රවීණ නර්තන ශිල්පීන් සහභාගි වන සාකච්ඡා මණ්ඩප, වාර්තා වැඩසටහන්, රූපවාහිනී මගින් විකාශනය වන බව.
- රූපවාහිනිය මගින් සියලු වයස් කාණ්ඩවලට අයත් නර්තන තරඟ හා නර්තන ප්‍රවණතා හඳුනාගත් බව.
- තරඟ විනිශ්චය සඳහා විනිශ්චය මණ්ඩලවලට අමතරව SMS මනාපවලට ප්‍රමුඛතාව ලබාදෙමින් ප්‍රේක්ෂකයන් සහභාගි කරගන්නා බව.
- ගෝලීය නර්තන ප්‍රවණතා අන්තර්ජාලය ඇසුරු කරගනිමින් නරඹන බව.
- වාණිජ, ආර්ථික කටයුතු සඳහා වෙළඳ ප්‍රචාරණයට නර්තනය උපයෝගි කර ගන්නා බව.

*ජනසන්නිවේදන මාධ්‍ය බලපා ඇති අයුරු සාකච්ඡා කර තිබීමට ලකුණු 06*

(iii) **ප්‍රාසංගික නර්තන නිර්මාණකරණය සඳහා සංගීතය, රංග වස්ත්‍රාභරණ, අංග රචනය සහ ආලෝකකරණය යොදා ගැනීමේදී ඖචිත්‍ය බව වැදගත් වේ. ඔබගේ අදහස් දක්වන්න.**

- සංගීතය
  - අධි තාක්ෂණික උපකරණ භාවිත කරමින් සංගීතය යොදා ගන්නා බව.
  - දේශීය හා විදේශීය වාද්‍ය භාණ්ඩ ඒ සඳහා යොදා ගන්නා බව.
- රංග වස්ත්‍රාභරණ
  - විවිධ වර්ණවලින් යුතු විසිතුරු රංග වස්ත්‍රාභරණ නිර්මාණය කර ගන්නා බව.
  - රංග වස්ත්‍ර නිර්මාණයේදී විසිතුරු ගල් හා රිබන් ආදී විචිත්‍ර වූ අලංකාර රෙදි වර්ග යොදා ගන්නා බව.
  - අතීතයේ පල්ප් නිර්මාණ, රිදී වලින් සැකසුණු ආභරණ වෙනුවට රබර් ෂීට් හැඩතල, වර්ණ ආලේප, ගල්වලින් වර්ණවත් කරගත් ආභරණ නිර්මාණය කරගන්නා බව.
  - විවිධ ආභරණ භාවිතයේ දී භාරතීය සම්භවයකින් යුත් ආභරණවල හැඩයන් භාවිත කරන බව.
- අංග රචනය
  - වේශ නිරූපණය සඳහා විවිධ ක්‍රම ශිල්ප භාවිත කිරීම.

    අයි ලෑෂස්, අයි ලයිනර්, පෑන්කේක්, අයි ෂැඩෝ, විවිධ තොල් ආලේපන ..... ආදිය
- ආලෝකකරණය
  - ඩිජිටල් තාක්ෂණික උපකරණ භාවිත කරමින් ආලෝක ක්‍රම ශිල්ප භාවිත කරන බව.
  - විවිධ විදුලි පහන් වර්ග අවශ්‍යතා මත භාවිත කරන බව.

*ඖචිත්‍ය බව පිළිබඳව අදහස් දක්වා තිබීමට ලකුණු 08*

**08. ආනුෂංගික කලා භාවිතයේ සුවිශේෂත්වය නිසා අද්‍යතන ප්‍රාසංගික නර්තන නිර්මාණකරණයට ද ප්‍රමුඛත්වයක් හිමි වී ඇත.**

**(i) චිත්‍ර කලාවේ මූලිකාංග, නර්තන කලාව හා බැඳෙන ආකාරය උදාහරණ සහිතව දක්වන්න.**

- වර්ණ, රේඛා, හැඩ හා හැඩතල, අවකාශය හා ආකෘතිය නර්තන කලාව හා බැඳෙන ආකාරය හඳුනාගෙන ඇති බව.
- රංග වස්ත්‍ර නිර්මාණයේදී වර්ණ, මෝස්තර, හැඩතල යොදාගන්නා බව.
- අංග රචනයේදී වර්ණ, රේඛා, හැඩතල භාවිත කරන බව.
- පසුබිම් අලංකරණයට අදාළ ආනුෂංගික කලා නිර්මාණය කරගන්නා බව.
- ශාන්තිකර්ම සඳහා අවශ්‍ය සැරසිලි හා රංග භාණ්ඩ සඳහා චිත්‍ර කලාවෙහි විවිධ ද්‍රව්‍ය හා ශිල්පක්‍රම යොදා ගන්නා බව.
  - බලි ඇඳීම, බලි ඇඹීම, වර්ණ ගැන්වීම.
  - මඩු සැරසිලි, අයිලය, යහන, මල්පැල, තොරණ, රංග භාණ්ඩ හා රංග උපකරණ ආදිය

*ඉහත කරුණු 3 ක් උදාහරණ සහිතව විස්තර කිරීමට ලකුණු 06*

**(ii) චරිතාංග අංගරචනය යනු කුමක් දැයි පැහැදිලි කරන්න.**

- නළු භූමිකාවේ බාහිර වේශය අවබෝධ කරගනිමින් කරනු ලබන චරිතයේ ස්වරූපය චරිතාංග අංගරචනය වන බව.
  - ශාන්තිකර්මවල අන්තර්ගත චරිතාත්මක අංගරචනය සඳහා යොදා ගනු ලබන විධි ක්‍රම (වෙස් මුහුණු, අංග රචන ද්‍රව්‍ය)
  - වේදිකා නාට්‍යවල විවිධ චරිත අංග රචනය කිරීම.

*ඉහත කරුණු විස්තර කිරීමට ලකුණු 06*

**(iii) රංග භූමිය හා නූතන වේදිකාව අර්ථ කථනය කොට පින්තූර රාමු වේදිකාවේ සුවිශේෂ ලක්ෂණ විග්‍රහ කරන්න.**

- සජීවී ලෙස නර්තනයක්, රංගනයක් ප්‍රේක්ෂකයන් ඉදිරියේ සිදුකරන ස්ථානය රංග භූමිය බව.
  නූතන වේදිකාව යනුවෙන් හැඳින්වෙන්නේ අද්‍යතනයේ බහුලව භාවිතාවන නූතන තාක්ෂණික මෙවලම් සහිත වේදිකාව බව.
- ප්‍රොසීනියම් වේදිකාව යනු
  - තුන් පැත්තකින් ආවරණය වූ ඉදිරිපස ප්‍රේක්ෂකයන්ට දර්ශනය වන බිත්ති හතරකින් යුත් අසුන්ගතව නැරඹිය හැකි රංග ශාලාවක් බව.

*ඉහත කරුණු විස්තර කිරීමට ලකුණු 08*